**සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගම - 2018**

## 1.1 ව්‍යාවනය කළ මතය

සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ (සමාගම) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා

බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි  වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ  අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස  අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද  සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව  ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2012 දෙසැම්බර් 17 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා සහ සමාලෝචිත වර්ෂය සඳහා පිළිවෙලින් රු. 2,537,424 ක් සහ රු. 720,000 ක් වූ ඇමතුම් තැන්පතු මත පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ඉපැයීම් රු. 2,537,424 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා අලාභය රු. 720,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | සෑම ආදායමක්ම ගිණුම්ගත කළ යුතුය |
| (ii) රු. 6,945,702 ක් වූ පරිපාලන ආදායම රු. 7,520,396 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිපාලන ආදායම රු. 574,694 කින් වැඩියෙන් දක්වා තිබුණි. | - එම- | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (iii) 2018 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු රු. 3,042,709 ක් වූ ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT), ජාතිය ගොඩනැගීමේ බදු වියදම් ගිණුමට බැර කර ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ගිණුමට හර කර තිබුණි. එබැවින් ජාතිය ගොඩනැගීමේ බදු වියදම සහ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ශේෂය රු.6,085,418 කින් අඩුවෙන් දක්වා තිබුණි. | - එම- | ගෙවිය යුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (iv) 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණය හිමි ශේෂයෙහි ඇතුළත් සෘණ ශේෂයන් හේතුවෙන් වෙළඳ ණයහිමියන් රු. 1,393,889 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | සෘණ ශේෂයන් ලෙස දැක්වෙන ණයහිමි ශේෂයන් විශ්ලේෂණය කර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂයන් දැක්විය යුතුය. |

**1.5.2** **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූලා‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ආදායම් | 236,156,668 | 231,523,417 | 4,633,251 | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ආදායම අදාළ වාර්තාව සමඟ සැසඳිය යුතුය. |

**1.5.3** **අවිනිශ්චිත ගිණුම්**

| අයිතමය | වටිනාකම රු.. | අවිනිශ්චිතව පැවති කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| බැංකු ශේෂය | 278,519 | අවුරුදු 2ක් සහ මාස 8 ක් | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | නොසැසඳු වෙනස්කම් නිරවුල් කළ යුතුය. |

**1.5.4** **ආයතනයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු. 9,060,749 ක් වී තිබුණි. එබැවින් සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය යහපත් තත්ත්වයක නොවිය. | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | සමාගම තම වගකීම්වලට මුහුණ දීමේ හැකියාව ඇති වත්කම් තත්වයක් පවත්වා ගත යුතුය. |

**1.5.5** **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) ආදායම් | 236,156,668 | ඉන්වොයිසි, ඉදිකිරීම් ලේඛනය, ප්‍රමාණ බිල්පත්, කොන්ත්‍රාත් ගිවිසුම් | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | වටිනාකම තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | වියදම් | 225,576,523 | ඉන්වොයිසි, ඉදිකිරීම් ලේඛනය, ප්‍රමාණ බිල්පත් සහ කළ වැඩ වාර්තා | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | -එම- |
| (iii) | ගෙවිය යුතු ශේෂ | 261,268,951 | ඉන්වොයිසි, කොන්ත්‍රාත් ගිවිසුම් සහ කළ වැඩ වාර්තා භාණ්ඩ ලැබීමේ කුවිතාන්සි, ප්‍රමාණ බිල්පත් | -එම- | -එම- |
| (iv) | ලැබිය යුතු ශේෂ | 197,640,330 | ගෙවීම් වවුචර් සහ ඉන්වොයිසි | -එම- | -එම- |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ**

**1.6.1 ලැබිය යුතු ශේෂ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද රු. 4,818,061 ක් වූ ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |

| | | | |
|---|---|---|---|
| i. 5.1 වගන්තිය | සමාගම විසින් 2012 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| ii. 5.2.5 වගන්තිය | වාර්ෂික අයවැය සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඔබ විසින් යොමු කර ඇති ගැටළු පරීක්ෂා කර ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| iii. 7.4.1 වගන්තිය | සමාගම විසින් විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි. | -එම- | -එම- |
| iv. 9.2 වගන්තිය | සමාගම සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යා සකස් කර අනුමත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ /2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප | සමාගම විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් ලද ප්‍රතිඵලය රු. 9,123,914 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු. 2,410,505ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,713,409 ක පිරිහීමක් නිරීක්ෂණය විය.. ශුද්ධ ආදායම රු. 4,234,282 කින් අඩුවීම සහ පරිපාලන හා ආයතනික වියදම් රුපියල් 2,047,694 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට හේතු වී තිබුණි.